ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

පුවත්පත් නිවේදනය

<u>නුවර එළිය සීතා අම්මාන් කෝවිලේ භාවනා ශාලාව විවෘත කෙරේ</u>

නුවර එළිය සීතා කෝවිලේ (සීතා එළිය) අශෝක් වාතිකා භාවනා මධ්‍යස්ථානය 2025 අගෝස්තු 3 වන දින ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය විජිත හේරත් මැතිතුමා සහ ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මැතිතුමා විසින් විවෘත කරන ලදී. මෙම අවස්ථාව සඳහා සංචාරක නියෝජ්‍ය අමාත්‍ය මහාචාර්ය රුවන් රණසිංහ, අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය මධුර සෙනෙවිරත්න, පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය වී. එස්. රාධාක්‍රිෂ්ණන් යන මහත්වරුන්, ප්‍රජා නායකයන් මෙන්ම ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ බැතිමතුන් සහභාගී වූහ.

2. භාවනාව සහ ආධ්‍යාත්මික සුබ සිද්ධිය සඳහාම වෙන් වූ ස්ථානයක් වන අශෝක් වාතිකා අනුශ්‍රී භාවනා මධ්‍යස්ථානය ඉන්දියාවේ නව දිල්ලි නුවර බැතිමතුන්ගේ පෞද්ගලික ධන පරිත්‍යාගයන්ගෙන් ඉදි කරන ලදී. මෙම අවස්ථාව අමතමින් මහ කොමසාරිස්තුමා ආධ්‍යාත්මික වර්ධනය සඳහා ඔවුන් විසින් ලබා දුන් මෙම දායකත්වය දෙරට ජනතාව අතර පවතින ශක්තිමත් බැඳීම් තවදුරටත් තහවුරු කරන බව ප්‍රකාශ කළේය. කෝවිල ආශ්‍රිතව සංචාරක කර්මාන්තයට සුවිසල් විභවතාවයක් පවතින බව පෙන්වා දුන් මහ කොමසාරිස්තුමා විශේෂයෙන්ම ඉන්දියාව ඇතුළු රටවලින් ආගමික සංචාරකයන් ආකර්ෂණය කර ගැනිම සඳහා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමට තවදුරටත් ප්‍රයත්න දැරිය යුතු බව සඳහන් කළේය.

3. 2025 අප්‍රේල් මාසයේදී සිදු කළ ශ්‍රී ලංකා සංචාරය අතරතුරදී අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා සීතා අම්මාන් කෝවිලේ යටිතල පහසුකම් පුළුල් කිරීම සඳහා සහයෝගය ලබා දීමට ඉන්දියාවේ කැපවීම ප්‍රකාශ කළේය. මෙයට අමතරව අනුරාධපුරයේ පූජනීය නගර සංකීර්ණය සංවර්ධනය කිරීම සඳහා ද ත්‍රිකුණාමලය තිරුකෝනේෂ්වරම් කෝවිල සංවර්ධනය කිරීම සඳහා ද සහයෝගය ලබා දෙන බව එතුමා ප්‍රකාශ කළේය. මෙම මුලපිරීම් ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ශිෂ්ටාචාරමය බැඳීම් පිළිබිඹු කරන අතරම ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ශක්තියක් වෙමින් සංචාරක කර්මාන්තය නංවාලීම සඳහා ඉන්දියාවේ කැපවීම ද අවධාරණය කරයි.

***

**කොළඹ**
***2025 අගෝස්තු 03***